# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 837/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திகதி / Date – 18/05/2024 පැය 1130

## මාධ්‍ය නිවේදනය

**සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයින් 04 ක් සහ තවත් සැකකරුවන් 19 දෙනෙකු අත්අඩංගුවට - කළුතර, ගාල්ල, මාතර, කොළඹ, බස්නාහිර පළාත් දකුණ හා බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාස.**

2024.03.19 වන දින සිට බස්නාහිර පළාත හා දකුණු පළාත මූලික කර ගෙන ක්‍රියාත්මක සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයින් අත්අඩංගුවට ගැනීම සඳහා දිවයිනම ආවරණය වන පරිදි විශේෂ පොලිස් කණ්ඩායම් 20 ක් යොදවා මෙහෙයුම් ආරම්භ කරන ලදී. මෙම මෙහෙයුමට සම්බන්ධ බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසය, කොළඹ අපරාධ කොට්ඨාසය, මාතර අපරාධ කොට්ඨාසය හා බස්නාහිර පලාත් දකුණ අපරාධ කොට්ඨාසයේ විශේෂ පොලිස් කණ්ඩායම් විසින් පහත වැටලීම් සිදු කර ඇත.

1. 2024.05.17 වන දින බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් මිරිහාන පොලිස් වසමේදී වැටලීමක් සිදුකර සංවිධානාත්මක අපරාධ කල්ලි කණ්ඩායමකට සම්බන්ධ පුද්ගලයෙකු අත්අඩංගුවට ගෙන ඇත.

   **අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 63 ක් වන අතුරුගිරිය ප්‍රදේශයේ පදිංචිකරුවෙක් වේ.**

2. 2024.05.17 වන දින මාතර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් කොටවිල පොලිස් වසමේදී වැටලීමක් සිදුකර සංවිධානාත්මක අපරාධ කල්ලි කණ්ඩායමකට සම්බන්ධ පුද්ගලයෙකු අත්අඩංගුවට ගෙන ඇත.

   **අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 36 ක් වන මිරිස්ස ප්‍රදේශයේ පදිංචිකරුවෙක් වේ.**

3. 2024.05.17 වන දින බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් වත්තල පොලිස් වසමේදී වැටලීමක් සිදුකර සංවිධානාත්මක අපරාධ කල්ලි කණ්ඩායමකට සම්බන්ධ පුද්ගලයෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 41 ක් වන රාජගිරිය ප්‍රදේශයේ පදිංචිකරුවෙක් වේ.**

4. 2024.05.17 වන දින කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් කොම්පඤ්ඤවීදිය පොලිස් වසමේදී වැටලීමක් සිදුකර අයිස් මත්ද්‍රව්‍ය මිලි ග්‍රෑම් 1760 ක් සමඟ සංවිධානාත්මක අපරාධ කල්ලි කණ්ඩායමකට සම්බන්ධ පුද්ගලයෙකු අත්අඩංගුවට ගෙන ඇත.

   **අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42 ක් වන කොළඹ 02 ප්‍රදේශයේ පදිංචිකරුවෙක් වේ.**

ඉහත අත්අඩංගුවට ගන්නා ලද අපරාධ කල්ලි සාමාජිකයාට අමතරව ඔවුන් සමඟ විවිධ සම්බන්ධතා පවත්වමින් අපරාධවලට සහය දැක්වූ බවට සැක කරන තවත් සැකකරුවන් 19 දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත. **ඒ අනුව 2024.05.17 වන දින සැකකරුවන් 23 ක් අත්අඩංගුවට ගෙන ඇත.**

**මෙම මෙහෙයුම් ආරම්භ කරන ලද 2024.03.19 වන දින සිට 2024.05.17 වන දින දක්වා සමස්ත සැකකරුවන් හා සැකකාරියන් 1061 ක් අත්අඩංගුවට** ගෙන ඇති අතර, සංවිධානාත්මක අපරාධ සිදු කිරීම සඳහා සෘජුවම සහය දැක්වීම්, අපරාධ සැලසුම් කිරීම හා එම අපරාධ වලට ආධාර අනුබල දීම ආදී විවිධාකාරයෙන් සහය ලබා දුන් සැකකරුවන් හා සැකකාරියන් මේ අතර වේ.

අත්අඩංගුවට ගත් සැකකරුවන් සම්බන්ධව කොළඹ අපරාධ කොට්ඨාසය, මාතර අපරාධ කොට්ඨාසය, බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසය, බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසය මඟින් රැඳවුම් නියෝග ලබා ගෙන වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**